# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date: 2025.10.21 පැය 2100 | දුරකථන අංකය Tel.NO: 011-2887973 | මගේ අංකය My NO: D/Media/Out/1923/2025 | විද්‍යුත් ලිපිනය E-Mails: dir.media@police.gov.lk |


**තහවුරු නොකරන ලද විමර්ශන තත්ත්වයේ පවතින සහ අධිකරණ වල විභාග වන නඩු කටයුතු වලට අදාළ වන ඡායාරූප හා වීඩියෝ දර්ශන විද්‍යුත්, මුද්‍රිත මාධ්‍ය වල මෙන්ම සමාජ මාධ්‍ය ඔස්සේ පළ කිරීම සම්බන්ධව.**

අධිකරණයේ විභාග වන නඩු, ඉදිරියේදී අධිකරණ වෙත ඉදිරිපත් කිරීමට නියමිත නඩු, එලෙසම තහවුරු නොකරන ලද හා විමර්ශන තත්ත්වයේ පවතින කටයුතු වලට අදාල වන ඡායාරූප, වීඩියෝ හෝ සංස්කරණය කරන ලද හෝ නොකරන ලද දර්ශන හා AI තාක්ෂණයෙන් සංස්කරණය කරන ලද හෝ නොකරන ලද දර්ශන විවිධ මාධ්‍යයන් ඔස්සේ සංසරණය වන බව පෙනේ. මෙම දර්ශන මත්ද්‍රව්‍ය වැටලීම්, ඇතැම් අපරාධ වලට සම්බන්ධ විමර්ශන කටයුතු, ආන්දෝලනාත්මක සිද්ධීන් ආදිය සම්බන්ධව බවද නිරීක්ෂණය වේ.

මෙම ඡායාරූප, වීඩියෝ දර්ශන, එමෙන්ම සංස්කරණය කරන ලද හෝ නොකරන ලද AI දර්ශන අධිකරණයේ නඩු කටයුතු පවත්වාගෙන යන අවස්ථාවන් වලදී එකී විමර්ශනයන් වලදී වින්දිතයන්ට හා සාක්ෂිකරුවන්ට විවිධ බලපෑම් වලට මෙන්ම අගතිදායක තත්ත්වයන්ටද මුහුණ දීමට සිදු වන බවද පෙනී යයි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආයතන සංග්‍රහයට අනුව මාධ්‍ය වලට ප්‍රවෘත්ති සැපයීමේ සීමා සඳහන්ව ඇති අතර ඒ අනුව අමාත්‍යාංශ ලේකම්, දෙපාර්තමේන්තු ප්‍රධානියෙකුට හෝ එම ප්‍රධානියාගේ අභිමතය පරිදි පත් කරන යම් නිලධාරියෙකුට පමණක් මාධ්‍ය වෙත තොරතුරු සැපයිය හැකිය. ඒ අනුව ඉහත සිදුවීම් වලට අදාළ සත්‍ය හා නිවැරදි තහවුරු කර ගන්නා ලද තොරතුරු ඇතුලත් ඡායාරූප හා වීඩියෝ දර්ශන පොලිස් මාධ්‍ය කොට්ඨාසය මඟින් පමණක් සියළුම මාධ්‍ය වෙත මුදා හරිනු ලබන අතර එම ඡායාරූප හා වීඩියෝ දර්ශන සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පොලිසිය සෑම විටම වග කියනු ලබයි.

කරුණු එසේ හෙයින් ඉහත පරිදි සත්‍යයෙන් තොර, තහවුරු නොකරන ලද තොරතුරු සංස්කරණය කරන ලද හෝ නොකරන ලද ඡායාරූප හෝ වීඩියෝ දර්ශන ප්‍රචාරය කිරීමේදී ඒ ඒ මාධ්‍ය ප්‍රධානීන් සහ පුද්ගලයින් වගකීම් දරනු ඇති අතර එවන් අවස්ථාවලදී අගතියට පත් පාර්ශවයන් විසින් ගරු අධිකරණය තුලදී ප්‍රශ්ණගත ලෙස විමසීමකදී ද එම ආයතන හා පුද්ගලයින් වගකීමකට යටත් වනු ඇත.

කෙසේ වුවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් පිළිගෙන ඇති පුරවැසියෙකුට හිමි මූලික අයිතිවාසිකම් උල්ලංඝනයක් හෝ සීමා කිරීමක් මෙමඟින් කිසිසේත් සිදු කර නොමැති බවටද කාරුණිකව දන්වා සිටිමි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**